# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**ආයතන චක්‍රලේඛ ලිපි අංක : 03/2014**

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2014, මාර්තු මස 18 වන දින.

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>අනුග්‍රහ දුම්රිය බලපත්‍ර ලබාගැනීම</u>**

2013.11.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2013 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2014.01.23 දින රැස්වූ 888 වැනි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වාරයේදී 2013.11.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2013 වන "ආයතන සංග්‍රහයේ XVI වන පරිච්ඡේදයේ 2.5, 2.6, 2.7 වන උප වගන්ති සංශෝධනය කිරීම" යන චක්‍රලේඛය විශ්වවිද්‍යාල පද්ධතියෙහි ද ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2013 මේ සමඟ අමුණා ඇත.)

මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද විධිවිධාන වල කිසිදු වෙනසක් සිදු නොවේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත්:
1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මුල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මුල්‍යාධිකාරීවරුන්/ජ්‍යෙ.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තීය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූ.ජී.සී./එච්.ආර්./6/3/10

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 26/2013

මගේ අංකය: EST-7/WARNT/07/1010
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2013.11.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ආයතන සංග්‍රහයේ XVI පරිච්ඡේදයේ 2:5, 2:6 හා 2:7 උප වගන්ති සංශෝධනය කිරීම.**

ආයතන සංග්‍රහයේ XVI පරිච්ඡේදයේ 02 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම වගන්තියේ 2:5, 2:6 හා 2:7 උප වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2013.10.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

2:5. සෑම බලපත්‍රයකම ගමන් කරන දිනය නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය; නිකුත් කළ දිනය හා ගමන් කරන දිනය අතර කාලය, 2:7 උප වගන්තියේ දැක්වෙන ව්‍යතිරේකයට යටත්ව දවස් 30කට වැඩි නොවිය යුතුය.

2:6. එසේකුදු වුවත්, බලපත්‍රයේ දැක්වෙන "ගමන් කරන දිනය" ට කලින් දවස් 14 ඇතුළත දී හෝ එම දිනට පසුව එන දවස් 14 ඇතුළත දී හෝ බලපත්‍රයක් පාවිච්චි කළ හැකිය.

2.7 ඉඩ පහසුකම් කලින් වෙන් කරවා ගත හැකි විට (එනම් නිදන මැදිරියක, නිරීක්ෂණ මැදිරියක, වායු සමනය කළ දුම්රිය මැදිරියක යනාදියේ) බලපත්‍රයක් නිකුත් කරනු ලබන තැනැත්තාට යන ගමන සඳහා ඉඩ පහසුකම් වෙන් කරවා ගන්නා අවස්ථාවේ දී ආපසු එන ගමන සඳහා ද එසේ ඉඩ පහසුකම් වෙන් කරවා ගැනීමට හැකිවනු පිණිස, ආපසු එන ගමන සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයේ, එම බලපත්‍රය නිකුත් කරන දිනයේ සිට දවස් 45 නොඉක්මවන දිනයක් ගමන් කරන දිනය ලෙස සඳහන් කළ හැකිය.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය